වත්කම් බැරකම් ප්‍රකාශ නොදුන් අපේක්ෂකයන්ට එරෙහිව අල්ලස් කොමිසමට පැමිණිලි කරනවා

- පැහැරල් සංවිධානය

ඉන්දික හේවාවිතාරණ

වත්කම් බැරකම් ප්‍රකාශ මැතිවරණ කොමිසමට භාර නොදුන් සියලු අපේක්ෂකයන්ට එරෙහිව අල්ලස් කොමිසමට පැමිණිලි කර, අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව පැහැරල් සංවිධානය සඳහන් කරයි.

පාර්ලිමේන්තු මැතිවරණ පනතට අනුව නාමයෝජනා භාරදී මාස තුනක කාලයක් තුළ වත්කම් බැරකම් ප්‍රකාශ මැතිවරණ කොමිසමට භාරදිය යුතු බවද එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවසීය.

නාමයෝජනා භාරදී මාස තුනකට අධික කාලයක් ගතවී තිබෙන තිසා වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදුන් පිරිස් පිළිබඳ, පොරපුරු දැනගැනීමේ පනත යටතේ මැතිවරණ කොමිසමෙන් මේ වනවිට ඉල්ලා තිබෙන බවද, ඒ මහතා පවසා සිටියේය.

යම් ලෙසකින් පාර්ලිමේන්තුවට තේරිපත් වී සිටින අපේක්ෂකයෙකු වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදීමට කටයුතු නොකර තිබුණහොත් ඔහුට හිමිව තිබෙන මන්ත්‍රී ධුරය අහෝසි වීමට පවා හිතී තිබෙන බවද, රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

පිරිසුදු දේශපාලනයක් රට තුළ ඇති කිරීම යටතේ වත්කම් බැරකම් ලබාදෙන සංස්කෘතියක් ඇති කිරීම මූලික කර ගනිමින් අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවද මෙහෙම පැවසීය.